# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2350/16 – 2023 සැප්තැම්බර් මස 19 වැනි අඟහරුවාදා – 2023.09.19

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

39 (1) වැනි වගන්තිය යටතේ ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ පනවන ලද්දාවූ ද, අංක 1519/23 හා 2007.10.17 වැනි දින දරන රජයේ *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද්දවූ ද, 2007 අංක 318 හා 2007.10.16 වැනි දින දරන ආඥාවේ සවිස්තරව දැක්වෙන ඉඩම් කොටස ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙත පැවරී තිබේ. එනමුත් මේ කියන ලද ඉඩම් කොටස් අතරින් මෙහි පහත විස්තර වන එම ඉඩම් කොටස්වල භුක්තිය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙනුවෙන් තවම භාරගෙන නැත. එබැවින් සංචාරක හා ඉඩම් අමාත්‍ය, නාලක ජූඩ් හරින් ප්‍රනාන්දු වන මම ඉඩම් අත්කර ගැනීමේ පනතේ 39 (1) වැනි වගන්තිය යටතේ මා හට පැවරී ඇති බලතල අනුව අංක 1519/23 හා 2007.10.17 වැනි දින දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ඉහත සඳහන් 2007 අංක 318 හා 2007.10.16/ වැනි දින දරන ආඥාවට අදාළ පු/නාත්/2006/249 හා 2006.11.29 දිනැති ප්‍රගමණ අනුරේඛනයේ සඳහන් ඉඩමෙහි වර්තමාන පිහිටීම දැක්වෙන PU/NTT/2022/114 දිනැති අනුරේඛනයෙහි සංශෝධිත අනුරේඛනය වන PU/NTT/2023/272 හා 2023.07.11 දිනැති අනුරේඛනයේ සඳහන් කැබලි අංක 01 කොටස පමණක් මෙම නියමය මඟින් ප්‍රත්‍යාදිෂ්ඨ කරමි.

හරින් ප්‍රනාන්දු,
සංචාරක හා ඉඩම් අමාත්‍ය.

මගේ අංකය: 13/99/VE/21.
ඉඩම් අත්කර ගැනීමේ නිලධාරිගේ අංකය:
නා/ඉ/3/අත්/99/4(II)
2023 අගෝස්තු මස 29 වැනි දින,
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

### උපලේඛනය

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, නාත්තන්ඩිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මැදපළාත සුළු කොට්ඨාසයේ, සිරිගම්පල ගමේ පිහිටි සර්වේයර් ජනරාල්ගේ අංක පු/නාත්/2006/249 හා 2006.11.29 දිනැති ප්‍රගමණ අනුරේඛනයේ සඳහන් ඉඩමෙහි වර්තමාන පිහිටීම දැක්වෙන PU/NTT/2022/114 අනුරේඛනයෙහි සංශෝධිත අනුරේඛනය වන PU/NTT/2023/272 හා 2023.07.11 දිනැති අනුරේඛනයේ දැක්වෙන පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණයන්ගෙන් යුක්ත ඉඩම් කැබැල්ලට මායිම්:

01. **කැබලි අංක 01 – සිරිගම්පලවත්ත – ප්‍රමාණය: හෙක්. 5.9699**

උතුරට: පී. රාමනාදන් හිමිකම් කියන සිරිගම්පල වත්ත; නැගෙනහිරට: පී. රාමනාදන් හිමිකම් කියන සිරිගම්පල වත්ත සහ කැබලි අංක 2; දකුණට: කැබලි අංක 2, පු2319 දරන මූලික පිඹුරේ කැබලි අංක 20 සහ පු2997 දරන මූලික පිඹුරේ කැබලි අංක 13,12,11; බටහිරට: පු2997 දරන මූලික පිඹුරේ කැබලි අංක 5,4,39,1,27,2/2 සහ හැමිල්ටන් ඇළ.

EOG 09 – 0164

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 39 අ (1) වැනි වගන්තිය යටතේ නියමය

2012 පෙබරවාරි මස 13 වැනි දින අංක 1745/2 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශේෂ ගැසට් පත්‍රයෙහි* (460 වැනි අධිකාරිය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ පල කරන ලද 2012 අංක 11 දරන ආඥාවේ සඳහන් ඉඩම් කොටස් රජය වෙත සම්පූර්ණයෙන් ම සතු වී ඇති අතර, රජය සඳහා සහ ඒ වෙනුවෙන් එකී පනතේ 40 වැනි වගන්තියෙහි (අ) ඡේදය යටතේ එම ඉඩම් කොටස්වල සන්තකය ද ලබාගෙන තිබේ. එහෙත් එම පනතේ (1979 අංක 8 දරන පනතින් ඇතුළත් කරන ලද) 39 අ (1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව සංචාරක හා ඉඩම් අමාත්‍ය, නාලක ජූඩ් හරින් ප්‍රනාන්දු වන මම එකී ඉඩම් කොටස් අතුරින් මෙහි 1 වන උප ලේඛනයේ සඳහන් ඉඩම් කොටස් පමණක් මෙම නියමය මඟින් අවසතු කරමි.

හරින් ප්‍රනාන්දු,
සංචාරක හා ඉඩම් අමාත්‍ය.

මගේ අංකය: 4-3/9/2011/IR/46.
ප්‍රාදේශීය ලේකම්ගේ අංකය: U/P/4/LAA/2011/02
2023 අගෝස්තු මස 31 වැනි දින,
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

### උපලේඛනය

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, ඌවපරණගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, දෙහිවිනිපළාත කෝරලේ සුළු කොට්ඨාසයේ, ඩවුන්සයිඩ් (53පී) ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ කොටවෙරළඩගම ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අ.ග.පි 48, අතිරේක අංක 7, පත්‍ර අංක 11 හා 2014.05.30 දිනැති අවසාන ගම් පිඹුරෙහි සවිස්තරව පෙන්නුම් කර ඇති පහත සඳහන් නම් වලින් හා ප්‍රමාණයන්ගෙන් යුක්ත ඉඩම් කැබැල්ලකට මායිම්:

01. **කැබලි අංක 401 – මොරගොල්ලහින්නේපතන – ප්‍රමාණය: හෙක්. 0.1361 පමණ**

උතුරට: කැබලි අංක 5ʲ (හි.පි.298182); නැගෙනහිරට: කැබලි අංක 402,404 සහ 405; දකුණට: කැබලි අංක 402,404 සහ 406 සහ 400; බටහිරට: කැබලි අංක 400, මාර්ගය (මාර්ග සංවර්ධන අධිකාරිය) සහ කැබලි අංක 5ʲ (හි. පි. 298182).

EOG 09 – 0165